# දුරාචාර සංස්කෘතිය පිටු දකින්න...

**පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන් දෙසූ මෙම බණ වෙසක් මාසය නිමිත්තෙන් පළ කරමු**



යථා සාකටිකෝ පන්තං සමං හිත්වා මහා පථං
විසමං මග්ගමාරුයිහ අක්ඛච්ඡින්නෝව ඣායති
ඒවං ධම්මං අපක්කම්ම අධම්මමනුවත්තිය
මන්දෝ මච්චු මුඛං මුඛං පත්තෝ
අක්ඛච්ඡින්නෝව කඣායති

මඟට පැමිණි ගැල්කරු සමවූ මහා මාර්ගය අතහැර විසම මාර්ගයට පැමිණියේ කඩඇණය සිඳගෙන තැවෙන්නේය. එසේම ධර්ම මාර්ගයට පිටුපා අධර්මයට පැමිණියේ, ඒ මඳ වූ නුවණ ඇත්තා මාර මුඛයට පැමිණ කඩඇණට සිඳගත් ගැල්කරු මෙන් තැවෙන්නේය. මේ බුද්ධෝපදේශය පෙන්වා දෙන්නේ ලොව සනාතන දහමේ ක්‍රියාකාරීත්වයයි.

ලොව මිනිසාගේ පැවැත්ම පිළිබඳවද දැහැමි හා නොදැහැමි බව පැන-වෙන්නේය. සුචරිතය හා දුෂ්චරිතය යනුවෙන් හැඳින්වෙන්නේ මේ දැහැමි නොදැහැමි බවම වේ. ආගම්වල පැනවීම් නිසා හෝ පුද්ගල දෘෂ්ටි නානත්වය නිසා හෝ ආචාර හා සංස්කෘතික නානත්වය නිසා හෝ සමහර තැනකදී අධර්මය ධර්මය ලෙස සැළකුයේ වුවද, ලෝක ධර්මතාවයේ දී අධර්මය අධර්මයම මිස ධර්මය නොවේ. එසේම ධර්මය ධර්මය ලෙසම පවතී.

යම් කර්මයක විපාකය අනුන්ටත් තමන්ටත් දෙපසටමත් සුවදායක වේද ඒ දැහැමි කර්මයයි. අනුන්ටත් තමන්ටත් දෙපසටමත් දුක් විපාක ගෙන දෙන්නේ නම් ඒ කර්මය නොදැහැමි කර්මයක් වේ. මේ, ධර්මය අධර්මය නිගමනය කිරීමේ බෞද්ධ පිළිවෙතය.

මිනිස් වර්ගයා තමන් අවට සමාජයට හිරිහැරයක්, කරදරයක්, දුකක් නොවන ආකාරයට ජීවත් විය යුතු බව හෝ හැසිරිය යුතු බව ලෝක සම්මත වූ සදාචාරයේ නීතියයි. මෙම නීතිය උල්ලංඝණය කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. සාමාන්‍ය ලෝකයා යම් ලෙසකින් දඬුවම් ලැබිය යුතු වරදක් කරයි නම් ඒ වැරදි සියල්ල හාත්පසින් වටකොට ගත් කල ප්‍රධාන වැරදි පහක් ඇතුළත සංග්‍රහ වන්නේය. ඒ වැරදි පහ පංච දුශ්චරිතය ලෙස හැඳින්වේ. මේ පංච දුශ්චරිතයෙහි හැසිරීම අධර්ම චරියාව යැයි කියනු ලැබේ.

යෝ පාණමතිපාතේති මුසාවාදාඤ්ච භාසති
ලෝකෙ ආදින්නං ආදියති පරදාරඤ්ඤ ගච්චති
සුරාමේරය පාණඤ්ච යෝ නරෝ අනුයුඤ්ජති
ඉධෙව මේසෝ පුරිසෝ මූලං බණති අත්තනෝ

යෝ නරෝ - යම් නරයෙක් ප්‍රාණය නසයි නම්, බොරුත් කියයි නම්, නොදුන් දේ ගනී නම්, පරදාරාවන් වෙත යයි නම්, සුරා පානයත් කෙරෙයි නම්, නිරතුරු එවන් කර්මයන් කරන්නා සිය මූලය නැමැති හිස හෙවත් ආත්මය වනසා ගන්නේය. මෙහි ආත්මය යනු කර්මය කරනු ලබන පුද්ගලයාම වේ.

මේ දුශ්චරිතයෙන් වැළකීම බෞද්ධයාට පමණක් සීමා වූවක් නොවන බව 'යම් නරයෙක්' යනුවෙන් පැවසූ හෙයින් පැහැදිලි වේ. නරයා යනු මිනිසා මිස බෞද්ධයා නොවේ. එබැවින් පංච දුශ්චරිතයෙහි හැසිරීම ආගම් ජාති භේදයකින් තොරව මුළු මිනිස් සංහතියේම විනාශය පිණිස වන බව නුවණැති මිනිසා වටහා ගත යුතුය.

පංච දුශ්චරිතයෙහි බැඳුණු මිනිසා තමාගේ මෙලොව විනාශයත්, පරලොව විනාශයත් සිදු කර ගනී. ඔහු හෝ ඇය මුළු මහත් සමාජයටම වෛරය පතුරන්නෝද වේ. ඒ පංච දුශ්චරිතයෙහි නැවත නැවත යෙදීම හේතුවෙන් වර්ධනය වන මානසික දුෂ්ට බව සිහි නුවණ මොට කරවන්නේය. සිහි නුවණ මොට වීම සියලු අපරාධ වර්ධනයට පාදක වෙයි.

රටක ජනතාවගේ යහපත හෝ සුබසිද්ධිය සලසා ලීම රජුගේ වගකීමය. රටත් ජනතාවත් ආරක්ෂා කොට, ජනතාව අයහපතින් හෙවත් අධර්මයෙන් වළකා ධර්මයෙහි පිහිටුවීමත් ජනතාව සුඛිත කිරීමත් රජුගේ පරම යුතුකම වේ. 'රජු' යනුවෙන් හඳුන්වනු ලබන්නේ මෙසේ ජනතාව රංජනය කරනු ලබන්නාය. වර්තමානයෙහි ජනපති අගමැති දෙපළ ජනතාව රංජනය කිරීමේ කාර්යය සිදුකරනු ලබයි.

ජනතාව අධර්මයෙන් වළකා ධර්මයෙහි යොදවා සුඛිත කොට ජනරංජනය කිරීමට නම් රජු ද අධර්මයෙන් වැළකී දහමෙහි ඇලෙන්නෙකු විය යුතුය.

අධිෂ්ඨානයෙන් තොර වූවකුට ධර්මයෙහි හැසිරීමක් නැත. රජු දහමෙහි හැසිරීම රජුගේ අනුගාමික මැති ඇමති ජනයාටත්, සියලු රටවැසියාටත් යහපත පිණිස වන්නා සේම, රජුගේ දුශ්චරිතය හෙවත් අධර්මයෙහි හැසිරීම සියලු දෙනාටම දුක පිණිස, අහිත පිණිස පවතී. එබැවින් රජුගේ දැහැමි පැවැත්ම ආරක්ෂා කරනු පිණිස රජු විසින් අදිටන් කරනු ලැබිය යුතු තුන් දහමක් ඇත. එනම් බොරු කීමෙන් වැළකිය යුතුය, ක්‍රෝධශීලී නොවිය යුතුය, කෙළි ලොල් නොවිය යුතුය යන තුන් දහමයි.

මේ තුන් කරුණු රජුගේ රාජ ගෞරවයට හානියකි. රජකු කෙරෙහි පැවතිය යුතු සෘජු බවත්, මෘදු බවත් පහ කොට අභිමානය වනසාලන්නේය. එබැවින් ඉහත කී තුන් ධර්මයන් රජකු විසින් රාජ ව්‍රතයන් ලෙස සමාදන්ව ගනු ලැබිය යුතු බව බුදු වදනේ දැක්වේ.

රජු බොරු කියන්නේ නම් ඔහු තම දරුවන් වැනි රටවැසියා රවටන්නෙකි. රට වැසියා මුලා කරන්නෙකි. යමකු සිය බලකාමය නිසා හෝ ධන කාමය නිසා හෝ අන් කුමන කාරණයක් නිසා හෝ බොරු කියයි නම් හෝ බොහෝ කාලයක් තමාට අහිත පිණිස හා දුක පිණිස වූ කර්ම රැස් කරන බව කාමහේතු කාම නිදානං කමාධි - කරණං මුසා භාසන්ති තංතස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තති යනුවෙන් කළ දේශනාවේ දැක්වේ. බොරු කියන්නා කෙරෙහි රාජ ධර්මයෝ නොපිහිටති. එබැවින් බොරු කියන්නා රාජ්‍ය පාලනයෙහි සුදුසු නොවේ.

වර්තමාන ලෝකයේ පාලන තන්ත්‍ර රාජ ධර්මයන්ගෙන් හීන වූයේය. හීන වූයේ යම් තරමකින් හෝ රාජ ධර්ම පැවැතියේ නම් ඒ නායකත්වය යටතේ ජීවත් වන්නෝ සුවසේ වෙසෙන්නෝමය. වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකත්වයේ රාජ ධර්ම පවතින්නේ ඍණ තත්වයෙනි. සබ්බං රට්ඨං දුඛං සේති රාජා චේ හෝති අධම්මිකෝ රජු අධාර්මික වුයේ නම් රට සහිත වූ රට වැසියා දුකින් වෙසෙන්නේ යැයි කී පරිදි ශ්‍රී ලංකාවේ රට වැසියන් දුකින් දුකටම වැටී ඇත්තේ අධාර්මික රාජ්‍ය පාලනයන් හේතුවෙන් ඇතිවූ සකලවිධ දුරාචාරය හේතුවෙන් බව බුදු වදන් හා සසඳද්දී නිසැකයෙන් පැවසිය හැකිය.

රාජ්‍ය දුරාචාරයත් මාධ්‍ය දුරාචාරයත් එක්ව් අඩ සියවසක් පුරා, ශ්‍රී ලංකාව පුරා සංවර්ධනය කළා වූ පංච දුෂ්චරිතය හේතුවෙන් දැන් කුඩා දරුවාගේ පටන් වයෝවෘද්ධ වැඩිහිටියා දක්වාම දුෂ්ට මානසිකත්වය විසින් යටකර ගනු ලැබ ඇත. මෙහි ආදීනව සිංහල ජන කොටස වෙත කෙලින්ම සිදුකොට ඇති බලපෑම විනාශකාරී වූවකි. ශ්‍රී ලංකාවේ අන් සෑම ජනකොටසකටම ජාතික නායකත්වයක් ඇත. නැතහොත් ආගමික නායකත්වයක් ඇත. සිංහලයාට ජාතික නායකත්වයක් හෝ ආගමික නායකත්වයක් ඇත්තේම නැත. ඇත්තේ දේශපාලන නායකත්වයක් පමණි. ඒ සෑම දෙනා සිය බලකාමය මුල්කොට ජාතිය ආගම පමණක් නොව සිය මතු පරපුරද පාවා දෙන්නෝය.

සාසන ඉතිහාසය පුරාම බුදු සසුනේ ආරක්ෂාව සැලසීම රාජ්‍ය නායකයා හෙවත් රජු සතු කාර්යයක් විය. එය බුදු සසුනට පමණක් විශේෂ වූවක් නොවේ. ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් රාජ්‍යයන්ගේ පවා රටේ ප්‍රධාන ආගම ආරක්ෂා කිරීමට රාජ්‍ය නායකත්වය බැඳී සිටී.

අතීතයේ සිටි සැඳහැති රජවරු රාජ්‍ය බලය යොදා සසුන පිරිසිදු කොට ආරක්ෂා කළහ. වර්තමාන පාලකයෝ සදාචාර ධර්මයන්ගෙන් තොර වූවෝය. පංච දුශ්චරිතය සහිත සියලු දුරාචාරය හරය කොට ගත්තෝය. එබැවින් ඔවුනට ඇත්තේ ප්‍රසන්න මානසිකත්වයක් නොවේ. දුශ්චරිතගාමී නායකයන්ගේ අතවැසි ජනතාවගේ මානසිකත්වයද ප්‍රසන්න වූවක් නොවේ.

අප්‍රසන්න මානසිකත්වය හේතුවෙන් දුෂ්ට වූ හෝමෝනයන් නිසා මොළේ සෛලයන්ගේ ක්‍රියාකාරීත්වය දුර්වල වීම නොවැළැක්විය හැකිය. ආයෝගා භූරි සංඛයෝ පාපයන් දුරු කිරීම පිණිස යෝග නොකිරීමෙන් ප්‍රඥාව පිරිහෙන්නේ යැයි දේශනා කරන ලදී. ඒ දුර්වල වූ ප්‍රඥාවෙන් කියයි නම්, කරයි නම් තතොනං දුක්ඛමන්වේති. එතැන් පටන්, දුර්වල ප්‍රඥා සහිතව කරන ලද දුෂ්ට ක්‍රියාව අනුව, දුක පසුපස පැමිණීමද සිදුවන බව බුදු දහමෙහි පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයන්ගේ අරමුණ වූයේත්, අරමුණ වන්නේත් සකළවිධ දුරාචාරයන් හේතුවෙන් ලබන්නා වූ ලාබය කරණකොට ආදායම් ඉපැයීම විනා, රටේ ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගෙන වගාව හා කර්මාන්තයන් දියුණු කොට ඉන් ලැබිය හැකි ආර්ථික වාසිය ලැබීම නොවේ. දුරාචාරයෙන් දුෂ්ට වූ මනස ඇති ජනතාව මේ යථාර්ථය තේරුම් නොගැනීම ද පුදුමයක් නොවේ.

රටක් ජාතියක් ගැන නොතකන, ආගමක් දහමක් සදාචාරයක් නැති දේශපාලකයන් ධර්ම මාර්ගය ඉවත ලා අධර්ම මාර්ගය ගෙන ගමන් කිරීම සාරය ලෙස තීරණය කර තිබේ. එබැවින් ඔවුන් ඉතා උපක්‍රමශීලීව මව් කුස සිටින දරුවාටත් සුරාව හා දුම් වැටිය හඳුන්වා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත. පරගැති බව

26 වන පිටුවට